# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස - 2015/2016

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2017 නොවැම්බර්)

## BLE 101 - සූක්ෂම ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයිය යුතුය.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1. පහත ප්‍රකාශනයන්ට ඔබ එකඟ වන්නේද නැද්ද යන්න දක්වා, ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

i ආර්ථික විද්‍යාවේ පදනම හිඟකමයි .

(ලකුණු 05)

ii සංවර්ධිත රටවල ජනතාව ඉහල ආදායම් ලබන නිසා හිඟකම පිළිබඳ ගැටළුවක් ඔවුන්ට නොමැත .

(ලකුණු 05)

iii සූක්ෂම ආර්ථික විද්‍යාවේ අරමුණ රටක ජාතික ආදායම තීරණය වන ආකාරය විශ්ලේෂණය කිරීමයි .

(ලකුණු 05)

iv සීනි පරිභෝජනය අඩු කිරීම සඳහා රජය සීනි මත බදු පැනවිය යුතුය. මෙම ප්‍රකාශය යථානුරූපී ආර්ථික විද්‍යා ප්‍රකාශයකි.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

2. X හා Y භාණ්ඩ ඒකක (Q) වලින් ලැබෙන ආන්තික උපයෝගීතාවයන් (MU) පහත වගුවේ දක්වා ඇත.

| QX | MUX | QY | MUY |
|---|---|---|---|
| 1 | 1000 | 4 | 500 |
| 2 | 600 | 5 | 400 |
| 3 | 400 | 6 | 300 |
| 4 | 200 | 7 | 200 |
| 5 | 0 | 8 | 100 |

i X භාණ්ඩය රජය නොමිලේ සැපයීමට තීරණය කළහොත් පාරිභෝගිකයන් X භාණ්ඩයෙන් කොපමණ ඒකක ප්‍රමාණයක් මිලදී ගනීද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii පාරිභෝගිකයාගේ ආදායම රු.1000 වන අතර X භාණ්ඩයේ මිල රු.200 ක් හා Y භාණ්ඩයේ මිල රු.100ක් වේ නම් උපයෝගිතාවය උපරිම කර ගැනීම සඳහා පාරිභෝගිකයා X හා Y භාණ්ඩ වලින් කොපමණ ප්‍රමාණයක් මිලදී ගත යුතුද? එම අවස්ථාවේදී X හා Y භාණ්ඩ මත දරණ වියදම් ගණනය කරන්න.

(ලකුණු 10)

iii පාරිභෝගිකයාට තම ආදායම වියදම් කර X භාණ්ඩ ඒකක 1 ක් හා Y භාණ්ඩ ඒකක 8 ක් මිලදී ගත හැකිය. මෙම අවස්ථාවේදී පාරිභෝගිකයා සමතුලිතතාවයට පත් නොවන්නේ මන්ද? ඔබගේ පිළිතුර පැහැදිළි කරන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

3\. i පාරිභෝගික හැසිරීම පිළිබඳ සංඛ්‍යා සුචක (cordinal approach) හා ක්‍රම සුචක විශ්ලේෂණය (ordinal approach) අතර ඇති ප්‍රධාන වෙනස දක්වන්න.

(ලකුණු 05)

ii උදාසීනතා වක්‍ර විශ්ලේෂණයට අනුව පාරිභෝගිකයා සමතුලිතතාවයට පත්වන ආකාරය සුදුසු රූපසටහන් ඇසුරින් පැහැදිළි කරන්න.

(ලකුණු 05)

iii මිල පාරිභෝජන වක්‍රය පදනම් කරගෙන ඉල්ලුම් වක්‍රයක් නිර්මාණය කරන ආකාරය කෙටියෙන් පැහැදිළි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

4\. පහත සිදුවීම් සහල් වෙළඳපල සමතුලිතය මත ඇති කරන බලපෑම සුදුසු රූප සටහන් යොදාගෙන පැහැදිළි කරන්න.

i රජය වී සඳහා ලබා දී ඇති පොහොර සහනාධාරය ඉවත් කිරීම.

(ලකුණු 05)

ii පාන් පාරිභෝජනය දියවැඩියාව ඇති වීමට ඇති අවදානම වැඩිවන බවට මතයක් ජනතාව තුළ පැතිරයාම.

(ලකුණු 05)

iii රජය නිර්ණය පිටි සඳහා පනවා ඇති තීරු බදු ඉහළ නැංවීම.

(ලකුණු 05)

iv නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ විදේශීය කම්කරුවන් ශ්‍රී ලංකාවට පැමිණීම නිසා කෘෂිකාර්මික අංශයේ ශ්‍රම පිරිවැය අඩුවීම.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

5. i මිල ඉල්ලුම් නම්‍යතාව යනු පාරිභෝගිකයා භාණ්ඩයේ මිල වෙනස්වීමට දක්වන ප්‍රතිචාරයේ මිණුමකි. මෙම ප්‍රකාශය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii පහත ප්‍රකාශයන් සමඟ ඔබ එකඟ වන්නේ ද නැද්ද දක්වා, ඔබගේ පිළිතුර රූපසටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

(අ) නම්‍ය භාණ්ඩයක් මත පනවා ඇති බදු අනුපාතය ඉහළ දැමීම මගින් බදු ආදායම් ඉහළ නංවාගත හැකිය.

ලකුණු 04)

(ආ) අනම්‍ය භාණ්ඩයක් මත බදු පැනවූ විට බද්දෙන් වැඩි කොටසක් පාරිභෝගිකයා ගෙවනු ලබයි.

(ලකුණු 04)

(ඇ) උපරිම මිල (පාලන මිල) ලෙස රජය සෑම විටම තීරණය කරනු ලබන්නේ සමතුලිත මිලට ඉහළ මිලකි.

(ලකුණු 04)

(ඈ) රජය ආනයන මත බදු පැනවූ විට පාරිභෝගික අතිරික්තය ඉහළ යයි.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

6. i නිෂ්පාදන ක්‍රියාවලිය දිගුකාලය හා කෙටිකාලය ලෙස ප්‍රධාන අදියර දෙකකට බෙදා දැක්විය හැකිය. එම බෙදා දැක්වීමේ පදනම උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii කෙටි කාලයේදී නිෂ්පාදන ආයතනවල හැසිරීම හීනවන ආන්තික ඵලදායිතා න්‍යාය මත පදනම් වේ. මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii පහත සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) හීනවන පරිමාණානුකූල ඵල

(ආ) වැඩෙන පරිමාණානුකූල ඵල

(ඇ) ස්ථාවර පරිමාණානුකූල ඵල

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

7. i පහත වියදම් ස්ථාවර වියදම් හා විචල්‍ය වියදම් යටතේ වර්ගීකරණය කරන්න.

(අ) ප්‍රාග්ධන ණය ප්‍රතිපාදන

(ආ) විදුලි බිල්

(ඇ) ආයතන කළමනාකරුවන් සඳහා ගෙවන වැටුප්

(ඈ) තාවකාලික නිෂ්පාදන ශ්‍රමිකයන් සඳහා ගෙවන වැටුප්

(ඉ) ප්‍රචාරණ වියදම්

(ලකුණු 05)

ii පහත සංකල්ප අතර ඇති වෙනස්කම් පැහැදිලි කරන්න.

(අ) ගණකාධිකාරි පිරිවැය හා ආර්ථික පිරිවැය

(ආ) ආන්තික පිරිවැය හා සාමාන්‍ය මුළු පිරිවැය

(ඇ) පූර්ණ තරඟකාරී වෙළඳපල හා ඒකාධිකාරී වෙළඳපල

(ලකුණු 15)

**(මුළු ලකුණු 20)**